සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය    අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018    33 S I

# ඉතිහාසය I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

* සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
* අංක 01 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්න වල (1), (2), (3), (4) යන පිළිතුරු වලින් වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුල (X) යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස්ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

.(01) ශ්‍රී ලංකාවේ කෝට්ටේ රාජධානි සමයේ සිට මහනුවර රාජධානි සමය දක්වා ඉතිහාසය හැදෑරීම සඳහා වඩාත් යෝග්‍ය සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ,
1. ධාතු වංසය. 2.සංදේශ කාව්‍ය. 3. දළදා සිරිත. 4. බෝධි වංසය.

(02) උඩරට රාජධානි සමයේදී වසර දහනවයක් ශ්‍රී ලංකාවේ සිරකරුවෙකු ලෙස සිට ආපසු සිය රටට ගොස් ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් කොට වැදගත් ඓතිහාසික ග්‍රන්ථයක් රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා වන්නේ,
1. රිබෙයිරෝය. 2. පිලිප්පස් බැල්ඩියස්ය.
3. රොබට් නොක්ස්ය 4. ජෝන් ඩොයිලිය.

(03) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය දේශගුණික කලාප අනුව වර්ගීකරණය කිරීමේදී බෙල්ලන් බැඳි පැලැස්ස අයත් වන්නේ,
1. අර්ධ ශුෂ්ක කලාපයටය. 2. ශුෂ්ක කලාපයටය.
2. පහතරට තෙත් කලාපයටය. 3. පහතරට වියළි කලාපයටය.

(04) ඉතිහාසය හැදෑරීමේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස ගැනෙන "අභිලේඛන" කාණ්ඩය ඇතුළත් පිළිතුර තෝරන්න.
1. සෙල්ලිපි, මැටි පුවරු, තඹ තහඩු, රන් තහඩු. 2. නටඹුන්, රන් තහඩු, සෙල්ලිපි, මැටි බඳුන්.
3. කාසි, නටඹුන්, චිත්‍ර, මූර්ති, තඹතහඩු. 4. චිත්‍ර, මූර්ති, සෙල්ලිපි, තඹ තහඩු, රන් තහඩු.

(05) පහත සඳහන් මානවයින් අතුරින් ශ්‍රී ලංකාව ජනාවාස කිරීමට දායක වූ මානවයා වන්නේ,
1. හෝමෝසාපියන් ය. 2. හෝමෝ ඉරෙක්ටස්ය.
3. හෝමෝ නියැඩතාලෙන්සිස්ය. 4. හෝමෝ හැබිලිස්ය.

(06) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව තොරතුරු ලැබී ඇති පහත සඳහන් ස්ථාන කාලවකවානු අනුපිළිවෙළ අනුව පෙළ ගැසූ වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
1. පාහියන්ගල, පොතාන, බෙල්ලන්බැඳි පැලැස්ස, මාතොටය.
2. පාහියන්ගල, බෙල්ලන්බැඳි පැලැස්ස, පොතාන, මාතොටය.
3. මාතොට, පාහියන්ගල, පොතාන, බෙල්ලන්බැඳි පැලැස්සය.
4. බෙල්ලන්බැඳි පැලැස්ස, පාහියන්ගල, මාතොට, පොතානය.

(07) "බිම් වීදුරු නමින්" හැඳින්වෙන පිරිසිදු තිරිවානා ගල් භාවිතා කරමින් ජ්‍යාමිතික හැඩයෙන් යුත් ගල් මෙවලම් සකස් කරන ලද්දේ,
1. නව ශිලා යුගයේදී ය. 2. පූර්ව ශිලා යුගයේදී ය.
3. මධ්‍ය ශිලා යුගයේදී ය. 4. පූර්ව ඓතිහාසික යුගයේදී ය.

(08) වෙර යොදා බලයක් යෙදීමෙන් ගල් පතුරු ගලවා මෙවලම් තැනීමේ තාක්ෂණය හඳුන්වන ලද්දේ,
1. ස්ථිතික ජල තාක්ෂණය යනුවෙනි. 2. වජ්‍ර චුම්බිහට ක්‍රමය යනුවෙනි.
3. පීඩන අනුක්‍රමණය යනුවෙනි. 4. පීඩන ශල්කනය යනුවෙනි.

(09) ක්‍රි. ව. 3 වන සියවසේදී පමණ පොළව හාරා ඒ මත මැටි ආලේප කර නිවාස සකස් කළ බවට සාක්ෂි හමු වී ඇති ස්ථානයක් වන්නේ,
1. කොළඹගේ ආර උඩරංචාමඩෙමෙනි. 2. තිස්සමහාරාම වලගම්පත්තුවෙනි.
3. දඹුල්ල කළුදිය පොකුණෙනි. 4. අනුරාධපුර ඇතුල් නුවරෙනි.

(10) පූර්ව ඓතිහාසික යුගයේ විශාල ගල්පතුරු එක්තැන් කොට චතුරස්‍රාකාර හැඩයට සකසන ලද, ගල් පුවරුවකින් ආවරණය කර මිනිස් භස්මාවශේෂ තැන්පත් කිරීම සඳහා සකස් කළ ශිලා මංජුසා සොහොන් හමු වී ඇත්තේ,

1. හල්දුම්මුල්ල සුසාන භූමිය තුළිනි.
2. බෙරගල සුසාන භූමිය තුළිනි.
3. යටිගල්පොත්ත සුසාන භූමිය තුළිනි.
4. රංචාමඩම සුසාන භූමිය තුළිනි.

(11) අතීතයේ ගම්කයන් තෝරාගනු ලැබුවේ ගමේ සිටි ගෘහපතීන් අතරින් බව සඳහන් වන කෘතිය වන්නේ,

1. සමන්ත පාසාදිකාව.
2. සහස්සවත්ථුපකරණය.
3. දම්පියා අටුවා ගැටපදය.
4. සද්ධර්මාලංකාරය.

(12) අතීතයේදී යකඩ උඳුන් දැල්වීමට අවශ්‍ය කරන සුළං බලය මයිනහමක ආධාරයෙන් ලබාගෙන යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි හමු වී ස්ථානයකි.

1. සබරගමුව පළාතේ සමනළ වැව ප්‍රදේශය.
2. ඌව පළාතේ බෙරගල ප්‍රදේශය.
3. මධ්‍යම පළාතේ දෙන්ගහ ඇළ කන්ද ප්‍රදේශය.
4. ඌව පළාතේ හල්දුම්මුල්ල ප්‍රදේශය.

(13) ඇළහැර ඇළ මගින් ජලය සපයා ගන්නා වැව් පමණක් ඇතුළත් වන පිළිතුර තෝරන්න.

1. කවුඩුල්ල වැව, පදවිය වැව, ගිරිතලේ වැව හා කන්තලේ වැව.
2. මින්නේරිය වැව, පදවිය වැව, ගිරිතලේ වැව හා කවුඩුල්ල වැව.
3. මින්නේරිය වැව, පදවිය වැව, නාච්චිදූව වැව හා කන්තලේ වැව.
4. මින්නේරිය වැව, ගිරිතලේ වැව, කවුඩුල්ල වැව හා කන්තලේ වැව.

(14) පහත "අ" තීරුවේ ඇති වගන්තිය "ආ" තීරුව සමඟ ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | "අ" තීරුව | "ආ" තීරුව |
|---|---|---|
| 1. | වැව් වල ජලය භාවිත කරන්නන්ගෙන් අයකළ බද්ද | A - කැති අඩ |
| 2. | හේන් ගොවීන්ගෙන් අයකළ බද්ද | B - මතරමජිබක |
| 3. | රජුට අයත් ඉඩම්වල වගා කරන්නන්ගෙන් අයකළ බද්ද | C - දකපති |
| 4. | ඇළ මාර්ග වල මාළු අල්ලන අයගෙන් අයකළ බද්ද | D - බොජකපති |

1. ACBD
2. BDCA
3. DBAC
4. CADB

(15) අනුරාධපුර අභයගිරි කැණීම් වල දී හමු වූ ලෝහ කැබැල්ලෙහි "රන් දෙවිසිකළඳ" යනුවෙන් ලියා තිබීමෙන් පැහැදිලි වන්නේ,

1. අභයගිරි විහාර භූමිය තුළ රන් කම්හලක් බැවති බවයි.
2. විනිමය කටයුතු වල දී කාසි වෙනුවට රන්ලෝහ භාවිතා කළ යුතුයි.
3. ආගමික කටයුතු වලදීරත්රන් භාවිතා කළ බවයි.
4. අභයගිරි විහාරයට ජනතාව රත්රන් වලින් පූජෝපහාර පැවැත්වූ බවයි.

(16) A. කෘෂිකර්මාන්තය පිළිබඳ තොරතුරු අනාවරණය වන සෙල්ලිපි.
B. වෙළඳ සංගම් පැවති බවට තොරතුරු සඳහන් වන සාහිත්‍ය මූලාශ්‍රය.
C. අභ්‍යන්තර වෙළඳපොළ සහ වෙළඳපොළ පාලකයින් සිටිබව දැක්වෙන සෙල්ලිපිය.
D. වෙළඳ ශ්‍රේණි සහ කර්මාන්ත පිළිබඳ තොරතුරු සඳහන් වන සෙල්ලිපිය.

ඉහත සඳහන් වෙළඳාමට අදාළ පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍ය මූලාශ්‍ර අනුපිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.

1. කෝනිගල සෙල්ලිපිය, බඹරගස්තලාව සෙල්ලිපිය, බදුලුටැම් ලිපිය, පෙරිමියන්කුලම් ලිපිය.
2. කෝනිගල සෙල්ලිපිය, බදුලුටැම් ලිපිය, අට්ඨකථා, පෙරිමියන්කුලම් ලිපිය.
3. බදුලුටැම් ලිපිය, කෝනිගල සෙල්ලිපිය, අට්ඨකථා, පෙරිමියන්කුලම් ලිපිය.
4. කෝනිගල සෙල්ලිපිය, පෙරිමියන්කුලම් ලිපිය, බඹරගස්තලාව සෙල්ලිපිය, අට්ඨකථා.

(17) චීනයේ සිට පැමිණි "චෙංහෝ" සෙනවියා විසින් ගාල්ලේ පිහිටුවන ලද "ත්‍රිභාෂා" සෙල්ලිපියේ ඇතුළත් වන භාෂා වන්නේ,

1. චීන, පර්සියානු, සංස්කෘත.
2. චීන, පර්සියානු, දෙමළ.
3. චීන, ලතින්, සංස්කෘත.
4. චීන, අරාබි, දෙමළ.

(18) ශ්‍රී ලංකාවේ අතීත පාලකයින් ජාති, ආගම් අතින් වෙනස් වුව ද අසල්වැසි රටවල ජනතාව සමඟ ඉතා විශ්වාසවන්තව කටයුතු කළ බව පෙන්නුම් කිරීමට දිය හැකි සුදුසුම උදාහරණය වන්නේ,

1. I වන විජයබාහු රජු දළදා මාලිගාවේ ආරක්ෂාව වෛලයික්කාර හමුදාවට පැවරීම ය.
2. I වන බුවනෙකබාහු රජු ඊජිප්තුවට වෙළඳ තානාපතිවරු පිටත් කර හැරීමය.
3. භාතිකාභය රජු රුවන්වැලිසෑය සැරසීමට රෝමයෙන් වීදුරු පබළු ගෙන්වා ගැනීමය.
4. I වන ගජබාහු රජු පත්තිනි දේවාලයක් විවෘත කිරීමට දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයට යාම.

(19) අතීතයේදී සකස් කරන ලද කැඳ වර්ග අතර, සහල් කොටසකට වතුර කොටස් හයක් යොදා රෝගීන් සඳහා සකස් කළ කැඳ වර්ගය හැඳින්වූයේ,

1. දියකැඳ
2. රස උළුකැඳ
3. යවාගු
4. ඇඹුල් කැඳ

(20) පරිසර සංරක්‍ෂණය යටතේ කැලෑවල ගස්කොලන් කළමණාකරණයේ දී රජය විසින් පනවා තිබූ නීතිරීති වලට අනුකූලව රාජ්‍ය නිලධාරීන් කටයුතු කළ යුතු බවට උපදෙස් ලබාදී ඇත්තේ,
1. අනුරාධපුර පුවරු ලිපියේය. 2. බුද්දන්නේහෙල සෙල් ලිපියේය.
3. වෙහෙරකේම සෙල් ලිපියේය. 4. කොණ්ඩවට්ටවාන් ටැම් ලිපියේය.

(21) පැරණි ශ්‍රී ලාංකික සමාජය තුළ රාජ්‍ය පාලනය සඳහා කාන්තාවන්ට අවස්ථාව ලබා දී තිබූ බව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් මෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර වලින් ද සනාථ වී ඇති රැජින ලෙස හඳුන්වන්නේ,
1. කල්‍යාණවතී රැජින. 2. චූල සීවලී දේවි රැජින 3. ලීලාවතී රැජින. 4. තලතා ලක්ෂ්මී රැජින.

(22) යාපහුව රාජධානියේ පියගැට පෙළ හා කුළුණු නිර්මාණය සඳහා යොදාගෙන ඇත්තේ,
1. පාණ්ඩ්‍ය හා චෝල ගෘහ නිර්මාණ ශිල්පයයි. 2. චෝල හා කාම්බෝජ ගෘහ නිර්මාණ ශිල්පයයි.
3. පාණ්ඩ්‍ය හා කාම්බෝජ ගෘහ නිර්මාණ ශිල්පයයි. 4. පාණ්ඩ්‍ය හා රෝම ගෘහ නිර්මාණ ශිල්පයයි.

*** පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 23 සහ 24 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - විජයබාකොල්ලය නිසා කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදීයාම.
B - මුල්ලේරියා සටනින් පෘතුගීසින් අන්ත පරාජයට පත්වීම.
C - පස් යොදුන් රට සිංහල පෙරලිය හෝ සිංහල සංගය නමින් කැරැල්ලක් ඇතිවීම.
D - පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන ආරම්භ කිරීම.

(23) ඉහත සිදුවීම් වල නිවැරදි ඓතිහාසික අනුපිළිවෙල දක්වන්න.
1. DCAB 2. DCBA 3. CDAB 4. CDBA

(24) "C" අක්ෂරය හා සම්බන්ධ ඓතිහාසික සිදුවීම සිදුවූයේ කුමන රජතුමාගේ පාලන කාලයේ ද?
1. VI වන විජයබාහු රජු. 2. VI වන පරාක්‍රමබාහු රජු.
3. VIII වන වීර පරාක්‍රමබාහු රජු. 4. VI වන බුවනෙකාහු රජු.

*** පහත සඳහන් දේශ ගවේෂණ තොරතුරු වලට අදාළව,**

A - ලෝකය වටා ප්‍රථමයෙන්ම ගමන් කිරීමේ ගෞරවය හිමිවීම.
B - දකුණු අප්‍රිකාවේ කුණාටු තුඩුව දක්වා යාත්‍රා කිරීම.
C - ක්‍රි.ව. 1492දී හිස්පැනියෝලා දිවයිනට ගොඩබැසීම.
D - "අපි කුළුබඩු සහ ක්‍රිස්තු භක්තිකයන් සොයා පැමිණයෙමු."
යැයි ප්‍රකාශ කිරීම

(25) ඉහත තොරතුරු ඇසුරෙන් යුරෝපා ජාතීන්ගේ බල ව්‍යාප්තිය හා සම්බන්ධ සිද්ධීන් වලට අදාළ වන පුද්ගලයන් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක්ද?
1. පර්ඩිනන් මැගලන්, බර්තෝලමියු ඩයස්, වස්කෝද ගාමා, ක්‍රිස්ටෝපර් කොළොම්බස්.
2. පර්ඩිනන් මැගලන්, බර්තෝලමියු ඩයස්, ක්‍රිස්ටෝපර් කොළොම්බස්, වස්කෝද ගාමා.
3. බර්තෝලමියු ඩයස්, පර්ඩිනන් මැගලන් මැගලන්,ක්‍රිස්ටෝපර් කොළොම්බස්, වස්කෝද ගාමා
4. පර්ඩිනන් මැගලන්, වස්කෝද ගාමා, බර්තෝලමියු ඩයස්, ක්‍රිස්ටෝපර් කොළොම්බස්.

(26) පහත වගුවේ A සිට L දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 26 සහ 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රට | විද්‍යාඥයාගේ නම | නව සොයාගැනීම් |
|---|---|---|
| A. එංගලන්තය.<br>B. ඉතාලිය..<br>C. පෝලන්තය.<br>D. ජර්මනිය. | E. නිකලස් කොපර්නිකස්.<br>F. අයිසෙක් නිව්ටන්.<br>G. ජොහැන්ස් කෙප්ලර්<br>H. ගැලිලියෝ ගැලිලි | I. ගුරුත්වාකර්ෂණ නියමය.<br>J. දුරදක්නය.<br>K. පෘථිවිය ගෝලාකාර බව.<br>I. ග්‍රහලෝක සූර්යයා වට ඉලිප්සාකාරව ගමන් කරන බව |

(26) ඉහත වගුව ආශ්‍රයෙන් ගුරුත්වාකර්ෂණ නියමයට අදාළ පිළිතුර තෝරන්න.
1. CFI 2. DGJ 3. AEI 4. AFI

(27) "අත්හදා බැලීමේ පියා" යන අන්වර්ථ නාමයෙන් හැඳින් වූ විද්‍යාඥයාට අයත් තොරතුරු ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.
1. CFJ 2. DHL 3. BHJ 4. CGK

(28) ක්‍රි.ව. 1623 දී ලන්දේසීන් විසින් පහර දී අත්පත් කරගත් කුළුබඩු වලින් සපිරි අග්නිදිග ආසියාතික දූපත් වන්නේ,
1. ඇම්බොයිනා දූපත් ය. 2. කේප්වර්ඩ් දූපත් ය.
3. ජාවා දූපත් ය. 4. පිලිපීන දූපත් ය.

*** පහත සඳහන් කරුණු අධ්‍යයනය කර 29 හා 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ඉඩම් අහිමි ජනතාව බිහිවීම.
B - ගම්සභා ක්‍රමය අහෝසි වීම.
C - කාර්මික විප්ලවයේ, බලපෑම අප රටට ලැබීම.
D - ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රට තුළ ව්‍යාප්ත වීම.
E - සාම්ප්‍රදායක ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව බිඳ වැටීම.
F - පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය ලැබීම.

(29) බ්‍රිතාන්‍ය පාලනය නිසා අප රටට උරුම වූ ප්‍රයෝජනවත් අංග පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
1. A, B හා C වේ. 2. C, D හා F වේ. 3. A, C හා E වේ. 4. B, E හා F වේ.

(30) බ්‍රිතාන්‍ය පාලනය නිසා අප රටට උරුම වූ අහිතකර බලපෑම් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
1. A, B හා E වේ. 2. A, B හා F වේ. 3. B, C හා D වේ. 4. C, D හා E වේ.

(31) බෞද්ධ පුනරු සමයේදී බෞද්ධ පූජනීය ස්ථාන රැකබලා ගැනීම සඳා මූලිකත්වය ලෙන කටයුතු කළ යුරෝපීය උගතුන් කාණ්ඩය දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ජෝර්ජ් ටර්නර්, හෙන්රි ඕල්කට්, රීස් ඩේවිඩ්, හෙන්රි පාකර්.
2. හෙන්රි ඕල්කට්, රීස් ඩේවිඩ්, එච්.සී.පී. බෙල්, හෙන්රි පාකර්.
3. ජෝර්ජ් ටර්නර්, රීස් ඩේවිඩ්, එච්.සී.පී. බෙල්, හෙන්රි පාකර්.
4. හෙන්රි ඕල්කට්, ජෝර්ජ් ටර්නර්, එච්.සී.පී. බෙල්, රීස් ඩේවිඩ්.

(32) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නව නියෝජන හා මැතිවරණ ක්‍රමයට අයත් නොවන්නේ,
1. ජනාධිපතිවරණය. 2. සරල බහුතර නියෝජන ක්‍රමය.
3. ජනමත විචාරණය. 4. සමානුපාතික නියෝජන ක්‍රමය.

*** පහත සඳහන් වගුවේ A සිට I දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 33 සහ 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| විප්ලවය | ඇතිවීමට බලපෑ හේතුව | විප්ලවයේ ප්‍රතිඵල |
|---|---|---|
| A. ඇමරිකන් විප්ලවය | D. රාජාණ්ඩු ක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ දූෂිත ඒකාධිපති පාලනය. | G. 1791 දී මූලික මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශය එළි දැක්වීම. |
| B. ප්‍රංශ විප්ලවය | E. නිදහස පිළිබඳ ජනතාව තුළ ඇති වූ උනන්දුව. | H. බෝල්ෂෙවික්වරුන්ගේ රජයක් පිහිටුවීම. |
| C. රුසියන් විප්ලවය | G. පාලකයන් ගතකළ අධි සුඛෝපභෝගී ජීවිතය. | I. ලෝකයේ ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බිහිවීම. |

(33) ඉහත තොරතුරු ඇසුරෙන් ඇමරිකන් විප්ලවය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
1. A, D හා G වේ. 2. A, F හා I වේ. 3. A, E හා I වේ. 4. A, E හා H වේ.

(34) ඉහත තොරතුරු ඇසුරෙන් රුසියන් විප්ලවය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,
1. C, E හා H වේ. 2. C, F හා H වේ. 3. C, E හා G වේ. 4. C, D හා H වේ.

පහත දැක්වෙන A හා B ඇසුරෙන් 35 හා 36 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
A - ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් කුමරු සහ බිරිඳ ඝාතනය කිරීම.
B - ඇමරිකා එක්සත් ජනපදය විසින් ජපානයේ හිරෝෂිමා, නාගසාකි යන නගර දෙකට බෝම්බ හෙළීම.

(35) පළමු ලෝක සංග්‍රාමය සම්බන්ධයෙන්,
1. A හා B සත්‍ය වේ. 2. A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.
3. B සත්‍ය වන අතර, A අසත්‍ය වේ 4. A හා B අසත්‍ය වේ.

(36) දෙවන ලෝක සංග්‍රාමය සම්බන්ධයෙන්,
1. B සත්‍ය වන අතර, A අසත්‍ය වේ. 2. A හා B සත්‍ය වේ.
3. A සත්‍ය වන අතර, B අසත්‍ය වේ 4. A හා B අසත්‍ය වේ.

*** පහත දැක්වෙන A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ/ පද යුගල අධ්‍යයනය කර 37 සිට 39 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - 1. කාර්මීකරණය.
2. පරිසර දූෂණය.

B - 1. පැසිට්ස්වාදය.
2. මුසෝලිනි.

C - 1. සුවස් අර්බුදය.
2. පිදෙල් කැස්ත්‍රෝ.

B - 1. එක්සත්ජාතීන්ගේ සංවිධානය.
2. මහාමණ්ඩලය

(37) පළමු වැන්නේ වැඩිවීම දෙවැන්න ඉහළ යාමට හේතු වන බව පෙන්වන ප්‍රකාශ/ පද යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

(38) පළමු වැන්නේ වර්ධනයත් සමඟ දෙවැන්න බලවත්වීම පෙන්වන ප්‍රකාශ/ පද යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

(39) පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොපෙන්වන ප්‍රකාශ/ පද යුගලය කුමක්ද?
1. A 2. B 3. C 4. D

(40) 1937 වර්ෂයේදී ජර්මනිය, ඉතාලිය, ජපානය එකතු වී ඇති කරගන්නා ලද රහසිගත ගිවිසුම හැඳින්වූයේ,
1. මධ්‍යම බලවතුන් යනුවෙනි. 2. මිත්‍ර බලවතුන් යනුවෙනි.
3. අධිරාජ්‍යවරුන් තිදෙනාගේ සංගමය යනුවෙනි. 4. බර්ලින්, රෝම, ටෝකියෝ අක්ෂය යනුවෙනි.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 33 S II |
|---|---|---|

# ඉතිහාසය II

කාලය පැය 03 යි

**සැලකිය යුතුයි.**
* I වන කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න හතරකටද III කොටසින් ප්‍රශ්න එකකටද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## 1 කොටස

(01) අ. පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

i. මහාතිත්ථ, ලංකා පටුන, මින්නේරි වැව, පරාක්‍රම සමුද්‍රය, කසාතොට ගම්පොළ, ගල්ඔය, මුල්ලේරියාව, බෙල්ලන් බැඳි පැලැස්ස, රංචාවඩම මිනිහාගල් කන්ද, ඉරණමඩු ජලාශය (ලකුණු 12යි)

ii. පොන්ඩිචේරි, කොන්ස්තන්ති නෝපලය, රතු මුහුද, මහා බ්‍රිතාන්‍ය,රෝමය, බතාවිය (ලකුණු 06යි)

ආ. I. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශ වල ගල් වල කොටා ඇති ඉර, හඳ, වටාපත, හක්ගෙඩිය, ඇත් අඩිය හා සත්වරූප යනාදියෙන් එකළ දක්වා ඇත්තේ මොනවාද?

B - ක්‍රි. ව. 250 තරම් ඈත කාලයේ රචිත බ්‍රාහ්මීය සෙල්ලිපි වල "පුරකමත" යන තනතුරු නාමයෙන් හැඳින්වූයේ කවුද?

C - කාර්මික විප්ලව සමයේ බැටළු වර්ග අභිජනනය කිරීමෙන් සත්ත්ව පාලන කටයුතු වල වෙනසක් ඇතිකළ පුද්ගලයාගේ නම ලියන්න.

D - ක්‍රි.ව. 1756 - 1763 කාලයේ ප්‍රංශය සමඟ මහා බ්‍රිතාන්‍ය කළ යුද්ධයට ගිය වියදම් පියවා ගැනීමට ඇමරිකානු ජනපද වලට බදු පැනවූ බ්‍රිතාන්‍ය අගමැතිවරයා කවුද? (ලකුණු 04යි)

A, හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

II. 1. A වලින් දැක්වෙන චිත්‍රය හඳුනාගෙන නම් කරන්න.
2. මෙම චිත්‍රය අඳින ලද ශිල්පියා නම් කරන්න.
3. මෙය කවර යුගයට අයත්වේද?
4. මෙම චිත්‍රය දැකිය හැකි ස්ථානය ලියන්න.



A (ලකුණු 04යි)

III. 1. B වලින් දැක්වෙන්නේ කුමක්ද?
2. එය පිහිටා ඇති නගරය නම් කරන්න.
3. මෙහි ඇති විශේෂත්වය නම් කරන්න.
4. මෙයින් සිදුවන ප්‍රධාන කාර්යය ලියන්න.



B (ලකුණු 04යි)

## II කොටස

(02) I. ප්‍රාග් ඓතිහාසික යුගයේ ඉරණමඩු සැකැස්මට අයත්

A - පහත රට වියළි කළාපීය ලෙන් දෙකක් ද,

B - පහතරට තෙත් කළාපීය ලෙන් එකක් ද, නම් කරන්න. (ලකුණු 03යි)

II. පූර්ව ඓතිහාසික යුගයේ මහා ශිලා සුසාන සම්ප්‍රදායට අයත්

A - ශිලා මංජුසා සුසාන හමු වූ ස්ථාන දෙකක් ද,

B - මැටි ඔරු සුසාන හමු වූ ස්ථාන දෙකක් ද, නම් කරන්න. (ලකුණු 04යි)

III. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ භෞතික සාධක දෙකක් නම් කර ඉන් එකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05යි)

IV. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ස්වභාව වල ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06යි)

(03) I. පළමු නාගරීකරණ අවධියේදී පහත සඳහන් ප්‍රදේශ වලින් වෙළඳාම සඳහා මෙහි පැමිණි ජන කණ්ඩායම් නම් කරන්න.

A - ග්‍රීක හා මැසිඩෝනියානු ප්‍රදේශ.

B - ඇෆ්ගනිස්ථානය.

C - මලය අර්ධද්වීපය. (ලකුණු 03යි)

II. පහත A , B, C, D යටතේ දක්වා ඇති අභිලේඛන මොනවාදැයි වරහන තුළින් තෝරා ලියන්න.

A - "පෝචනී රජ" නම් ප්‍රාදේශීය පාලකයෙකු පිළිබඳ සඳහන් වන අභිලේඛනය.

B - දසගම් ඇත්තන් විසින් විහාරයේ දානය පිළිබඳ ගැටළු ඇති වූ විට විසඳිය යුතු ආකාරය සඳහන් වන සෙල්ලිපිය.

C - "කාබොජ මහපුගීය" පිළිබඳ සඳහන් වන සෙල්ලිපිය.

D - "ලපනතිස්ස" නම් සිත්තරෙක් පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය.

(බෝවත්තේගල සෙල්ලිපිය, මුන්දගල සෙල්ලිපිය, කළුදිය පොකුණ සෙල්ලිපිය, නැට්ටුක්කන්ද සෙල්ලිපිය, ඇඹුල් ඇඹේ සෙල්ලිපිය, වෙස්සගිරිය සෙල්ලිපිය)

III. ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව අනුරාධපුර යුගයේදී මෙරට විවිධ වෘත්තිකයන් ජීවත් වූ බව උදාහරණ දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. අපරටේ අතීත ජන සමාජයේ කාන්තාවන්ට උසස් තත්ත්වයක් හිමි වී තිබූ බව උදාහරණ 3ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(04) I. ශ්‍රී ලාංකික අතීත තාක්‍ෂණය තුළ,

A - අනුරාධපුර යුගයේ ඉදිකළ මහා වැව් දෙකක්ද

B - පොලොන්නරු යුගයේ ඉදිකළ මහා වැව් එකක්ද නම් කරන්න. (ලකුණු 03යි)

II. පහත A , B, C, D යටතේ දක්වා ඇති ප්‍රකාශ සඳහා අදාළ පිළිතුරු ඉදිරියෙන් ලියා දක්වන්න.

A - නිශ්ශංකමල්ල රජු විසින් ප්‍රධාන මාවත් වල දුර දැක්වීමට ඉදිකරන ලද කණු.

B - දැදිගම සුතිඝර චෛත්‍යයෙන් හමුවූ ලෝකඩ ඇත් පහණ සඳහා යොදාගෙන ඇති මූලධර්මය.

C - අකුණු සැරවලින් ආරක්‍ෂාවීම සඳහා පුරාණ ගොඩනැගිලිවල යොදා ඇති උපකරණය.

D - සොරොව්වකින් වාරිමාර්ග ඇළ වලට ජලය මුදාහැරීම සඳහා සොරොව්ව සම්බන්ධ කර ඇති ගල් කුළුණ. (ලකුණු 04යි)

III. අතීත ජනතාව කෘෂිකාර්මික කටයුතු වලට අමතරව කර්මාන්ත ක්‍ෂේත්‍රය තුළද කටයුතු කළ බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. පරිසරයේ ඇති ස්වාභාවික නොඉඳුල් බව රැකගැනීමට අතීත රජවරු ක්‍රියාකළ ආකාරය උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(05) I. රජරට ශිෂ්ටාචාර සමයේදී මධ්‍ය පාලනයට අයත් පහත සඳහන් කාර්යයන් භාරව සිටි නිලධාරින්ගේ තනතුරු නාම පිළිවෙලින් සඳහන් කරන්න.

A - රාජ්‍ය භාණ්ඩාගාරය භාරව කටයුතු කළ තැනැත්තා.

B - වෙළඳ කටයුතු භාර ප්‍රධානියා.

C - නාගරික වාස්තු විද්‍යාඥයා. (ලකුණු 03යි)

II. පහත A , B, C, D ප්‍රකාශ වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා පිළිවෙලින් ලියා දක්වන්න.
A - ප්‍රථම වතාවට කෝට්ටේ ශක්තිමත් බල කොටුවක් ඉදිකළ පුද්ගලයා.
B - යාපහුව කඳුමුදුනෙහි බලකොටුවත් තැනූ වූ පුද්ගලයා.
C - ගෝවින්ද මලය කඳුමුදුනෙහි බලකොටුවක් තැන වූ පුද්ගලයා.
D - ගංදෙණිය පර්වතය මුදුනෙහි බලකොටුවක් තැන වූ පුද්ගලයා.
(සංඛ සෙනවි, නිශ්ශංක, අලගක්කෝනාර, බුවනෙකබාහු ආදිපාද, සුභ සෙන්පති, සපුමල් කුමරු, අම්බුළුගල කුමරු) (ලකුණු 04යි)

III. VI වන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05යි)

IV. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්වීමට බලපෑ හේතු උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(06) I. පහත A , B, C ප්‍රකාශ වලට අදාළ පිළිතුරු පිළිවෙලින් ලියන්න..
A - සීතාවක රාජසිංහ රජුට උඩරට යටත් කර ගැනීමට උදව් කළ ප්‍රභුවරයා -
B - පෘතුගීසින් මෙරටින් නෙරපා හැරීමට ලන්දේසීන්ගෙන් උදව් පැතූ උඩරට පාලකයා -
C - ක්‍රි.ව. 1766 දී ලන්දේසීන් සමග ගිවිසුමක් අත්සන් කළ උඩරට පාලකයා - (ලකුණු 03යි)

II. උඩරට රාජධානියේ රජු විසින් විසඳන ලද නඩු වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

III. උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිරවීමට ගත් ප්‍රයත්න අවස්ථා දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

IV. ශ්‍රී ලංකාව තුළින් උපරිම වාසි ලබාගැනීමට ලන්දේසින් අනුගමනය කළ ප්‍රතිපත්ති තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(07) I. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බිහි වූ පහත සඳහන් දේශපාලන පක්ෂවල ආරම්භක නායකයන් නම් කරන්න.
A - කම්කරු පක්ෂය. B - ලංකා සමසමාජ පක්ෂය. C - ලංකා ද්‍රවිඩ සංගමය.
(ලකුණු 03යි)

II. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 04යි)

III. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නායකයා වශයෙන් ජනාධිපතිවරයාට හිමිවන බලතල තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඡන්දය විමසීමේ ක්‍රම තුන නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06යි)

## III කොටස

(08) I. A - දකුණු ඇමරිකානු ප්‍රදේශවල ජනපද පිහිටුවූ යුරෝපා රටවල දෙකක් සහ,
B - උතුරු ඇමරිකානු ප්‍රදේශවල ජනපද පිහිටුවූ යුරෝපා රටවල එකක් ද නම් කරන්න.
(ලකුණු 03යි)

II. පහත A , B, C, D යටතේ දැක්වෙන ප්‍රකාශ හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.
A - ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා -
B - ප්‍රංශයේ ලුවී රාජ්‍යයේ අවසාන රජතුමා -
C - 1799 දී ප්‍රංශයේ බලය අල්වාගත් හමුදා නිලධාරියා -
D - බෝල්ෂෙවික් පක්ෂයේ නායකත්වයට පත් විප්ලවවාදියා - (ලකුණු 04යි)

III. ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලන හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05යි)

IV. රුසියන් විප්ලවයේ ප්‍රතිඵල තුනක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(09) I. දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මිත්‍ර පිලේ රටවල් දෙකක් සහ අක්ෂ පිලේ රටක් නම් කරන්න.
(ලකුණු 03යි)

II. පළමු ලෝක සංග්‍රාම අවධියේදී පහත නම් සඳහන් රට වල සිටි පාලකයින් නම් කරන්න.
A - ඇමරිකා එක්සත් ජනපදය. B - මහා බ්‍රිතාන්‍ය.
C - ප්‍රංශය. D - ඉතාලිය (ලකුණු 04යි)

III. පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ජර්මනියේ සහ ඉතාලියේ බිහි වූ දේශපාලන මතවාද දෙකක් නම් කර, ජර්මනියේ ක්‍රියා කලාපය දෙවන ලෝක මහා සංග්‍රාමයට හේතු වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

IV. දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලෝක දේශපාලනයේ ඇතිවූ වෙනස්කම් තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 06යි)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province


11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018
க.பொ.த (சா/த) முன்னோடிப் பரீட்சை - 2018
G.C.E. (O/L) Practice Test - 2018

33 II

# ඉතිහාසය II / வரலாறு II / History II

01. (අ) (i), (அ) (i), (A) (i)



සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය
தரம் 11
Grade 11

අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018
க.பொ.த (சா/த) முன்னோடிப் பரீட்சை - 2018
G.C.E. (O/L) Practice Test - 2018

33 II

# ඉතිහාසය II / வரலாறு II / History II

01. (අ) (ii), (அ) (ii), (A) (ii)

